**ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 206 - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති රීතී හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත

කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරි විසින් එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම. | 1. ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ අඩුපාඩු<br>2. ලේඛන හා පොත් පවත්වා නොතිබිම.<br>3. කළමනාකරණ දූර්වලතා | 2.1.1<br>2.11<br>2.6 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනිමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයිම් අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබිම. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව. | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු<br>2. බැඳීම් හා බැරකම් | 2.8(අ)(ආ)(ඇ)<br>2.4 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3(අ)(ආ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම. | 2.1.2 |
| 128(1)(උ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අය කර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අය කර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | හිඟහිටි ණය ශේෂ | 2.8 |

| | | | |
|---|---|---|---|
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | අවිධිමත් ගනුදෙනු | 2.5 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරියා වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරනු ලබන බව. | විසර්ජන ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.7(අ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 සැලැසුම් කිරිම

දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කර ඇති වෙනත් ආයතන 11 ක අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සමඟ පහත සඳහන් විස්තර ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය

(ආ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan)

#### 2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2018 ජුනි 03 දින වන විටත් සභාගත කර නොතිබුණි.

#### 2.1.3 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය සිදු කෙරේ.

කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

## 2.2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

-----------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 271.08 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 169.87 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

### 2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජෝන් ද සිල්වා සමරු රඟහල හා ජාතික කලාභවන ගොඩනැගිල්ල පරිශ්‍රයන් නවීකරණය කර සංවර්ධනය කිරීම සඳහා දින 365 කින් වැඩ අවසන් කිරීමට 2014 නොවැම්බර් 14 දින රු.මිලියන 386.5 කට කොන්ත්‍රාත්කරු සහ දෙපාර්තමේන්තුව අතර ගිවිසුමක් අත්සන් කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 415.98 ක් ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය සිදුකෙරේ.

අමාත්‍ය මණ්ඩලය විසින් තෝරාගත් සීමිත කොන්ත්‍රාත්කරුවන් පස්දෙනෙකුගෙන් ලංසු කැඳවා සැපයුම්කරුවකු තෝරාගෙන තිබුණි. එම සැපයුම්කරුට කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ක සේවා ගාස්තු අඩුකර ගෙන ගෙවීමට යටත්ව ලංසු ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට ගෙවූ මුදල වන රු.මිලියන 368.3 කින් සියයට 10 ක සේවා සැපයීමේ ගාස්තු වන රු. මිලියන 36.8 ක මුදල අඩු කිරීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි. මේ අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා උපදේශක සේවා සපයන මොරටුව විශ්වවිද්‍යාලය විසින් අමාත්‍ය මණ්ඩල තීරණය නොසලකා කටයුතු කර තිබුණි.

(ආ) "හෙළ ගී මග" සහ "අභිනය" වැනි පැරණි ශාස්ත්‍රීය ග්‍රන්ථ 13 ක් පිටපත් 1000 බැගින් රු.2,128,410 ක් වැයකර රජයේ හා පෞද්ගලික මුද්‍රණ ආයතන මඟින් මුද්‍රණය කිරීමට අදාළව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුද්‍රණය කළ ග්‍රන්ථ 05 ක ඇතැම් වචන මුද්‍රණය වී නොතිබීම, තීන්ත බොඳවීම, ඡායාරූප හඳුනා ගැනීමේ අපහසුව යනාදී මුද්‍රණ දෝෂ තිබියදීත් ගබඩාවට භාරගෙන ඒ සඳහා රු.783,500 ක් ගෙවීම් කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුට ලංසුව ප්‍රදානය කිරීමට පෙර වියදම සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන තිබෙන බවට ප්‍රසම්පාදන අස්ථිත්වය සහතික වියයුතු නමුත් 2016 වර්ෂයේ ප්‍රතිපාදන නොමැතිවීම නිසා ශාස්ත්‍රීය ග්‍රන්ථ 05 ක් සඳහා මුද්‍රණ ගාස්තු රු.796,410 ක් 2017 වර්ෂයේදී අවස්ථා දෙකකදී ගෙවා තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

-------------------------

දෙපාර්තමේන්තුවේ වතක්ම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) **වත්කම් ලේඛනගත කිරීම**

-----------------------------

ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ රු.7,235,638 ක්ද, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.8,800,000 ක්ද ගොඩනැගිලි සහ ඉදිකිරීම් රු.140,730,165 ක්ද වූ එකතු වටිනාකම රු.156,765,803 ක වත්කම් සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

2018 ජනවාරි 04 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී 2016 වර්ෂයේදී ගබඩාවට ලැබී තිබුණු " හෙළ ගී මග " , "අභිනය" 1,2,3,4,6 කලාප සහ " චිත්‍රපටිය" පොත් සියයට 54 සිට සියයට 75 දක්වා ද, අභිනය 5,7,8 හා 10 තොග සියයට 80 ට වැඩි පරාසයක ප්‍රමාණයකින් යුත් රු.1,572,305 ක් වටිනා පැරණි ශාස්ත්‍රීය ග්‍රන්ථ 9668 ක් 2018 ජනවාරි 04 දිනවන විට වර්ෂයකට ආසන්න කාලයක සිට අලෙවි කිරීමට හෝ පුස්තකාල සඳහා නොමිලේ ලබාදීමට කටයුතු නොකර ගබඩාවේ ඉතිරිව තිබුණි.

**2.4 බැදීම් හා බැරකම්**

-------------------

බැරකම් ලේඛනය, විසර්ජන ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශය හා සැසඳීමේදී වැය විෂය අංක 206-01-01-1409 යටතේ බැරකම් රු.34,000,000 ක් විසර්ජන ගිණුමෙහි වැඩියෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

**2.5 අවිධිමත් ගනුදෙනු**

-------------------

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

2017 රාජ්‍ය නාට්‍ය උළෙල සඳහා අභිනය 11 කලාපයේ පිටපත් 1000 ක් රු.210,000 ක් වැය කර රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් මුද්‍රණය කර තිබුණි. එහි මුද්‍රණ කටයුතු 2017 පෙබරවාරි 24 දිනට පෙර ඉටුකළ යුතු බව දක්වා තිබූ නමුත් 2017 මැයි 09 දින දක්වා ප්‍රමාදයකින් පසු ග්‍රන්ථ 690 ක් පමණක් ගබඩාවට ලැබී තිබුණි. ඉතිරි පිටපත් 310 දෙපාර්තමේන්තුවට ලැබුණු බවට සනාථ කිරීමේ භාණ්ඩ ලැබීම් පත්‍රිකාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.6 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් කටුවාවල පිහිටි ගොඩනැගිල්ලක දෙපාර්තමේන්තුවේ පොත් ගබඩාව ස්ථාපිත කර ඇත. වාකවුළු ආවරණය නොකිරීම නිසා කෘමි සතුන්ගෙන් පොත්වලට හානි වීම සිදුවීම, ගොඩනැගිල්ලට සිවිලිමක් නොමැති වීම, නිසා දැඩි උණුසුම නිසා මුද්‍රිත පොත්වල පිටු හැකිලී භාවිතයට ගත නොහැකි සේ විනාශ වී තිබීම, පොත් ගබඩා කර තැබීමට ප්‍රමාණවත් රාක්ක නොමැති වීම, ලී තට්ටුවක් මත පොත් ගොඩගසා තිබීම නිසා කෘමි සතුන්ගෙන් පොත්වලට හානි සිදුවීම, හදිසි ගින්නක් වැනි අවස්ථාවක පොත්වල ආරක්ෂාවට අවශ්‍ය පහසුකම් සලසාගෙන නොතිබීම, පහසුකම් සහිත වැසිකිළි හා කාර්යාල සේවක පහසුකම් පිළිබඳ අවධානය යොමු නොකිරීම, ආදී අඩුපාඩු රැසක් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම ගොඩනැගිල්ල දෙපාර්තමේන්තු පොත් සංරක්ෂණය හා බෙදාහරින තෙක් ගබඩාකර තැබීමට සුදුසු ස්ථානයක් නොවන බව සහ පොත්වල ආරක්ෂාව පිළිබඳ අවධානමක් පවතින බවද අනාවරණය විය. මෙම ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරියට අයත් බැවින් එය අලුත්වැඩියා කිරීමේ හැකියාවක්ද නොමැති අතර සුදුසු ගබඩා පහසුකම් සපයා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම කළමනාකරණයේ දුර්වලතාවයක් බව නිරීක්ෂණය කෙරේ.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 324.44 | 300.11 | 24.33 | 7.49 |
| | මූලධන | 152.30 | 41.19 | 111.11 | 72.95 |
| | **එකතුව** | **476.74** | **341.30** | **135.44** | **28.40** |
| 2014 | පුනරාවර්තන | 404.80 | 389.39 | 15.41 | 3.80 |
| | මූලධන | 186.55 | 139.03 | 47.52 | 25.47 |
| | **එකතුව** | **591.35** | **528.42** | **62.93** | **10.64** |
| 2015 | පුනරාවර්තන | 500.36 | 495.53 | 4.83 | 0.97 |
| | මූලධන | 296.74 | 256.98 | 39.76 | 13.40 |
| | **එකතුව** | **797.10** | **752.51** | **44.59** | **5.59** |
| 2016 | පුනරාවර්තන | 522.19 | 512.29 | 9.90 | 1.90 |
| | මූලධන | 334.95 | 238.68 | 96.27 | 28.74 |
| | **එකතුව** | **857.14** | **750.97** | **106.17** | **12.39** |
| 2017 | පුනරාවර්තන | 598.07 | 586.11 | 11.96 | 1.99 |
| | මූලධන | 275.86 | 173.07 | 102.79 | 37.26 |
| | **එකතුව** | **873.93** | **759.18** | **114.75** | **13.13** |

සමාලෝචිත වර්ෂයට අදාළව පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) විසර්ජන ගිණුම**

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රු.මිලියන 185.28 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 82.52 ක් උපයෝජනය කිරීමෙන් පසු එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 ක සිට සියයට 83 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 20601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27.00 | 21.41 | 13.00 | 18.38 | 70.00 | 61.19 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 766,334 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමෙහි හර ශේෂය සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂය අතර රු.444,761 ක වෙනසක් පැවතුණි. 2004 වර්ෂයට පෙර සිට පැවත එන මෙම වෙනසට හේතුන් සොයා එය නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් පාලන ගිණුමේ වර්ෂ අවසාන හර ශේෂය අතර රු.220,990 ක නොසැසඳු ශේෂයක් පැවතුණි. ඉන් රු.211,738 ක් සඳහා පමණක් හේතු පැහැදිලි කර තිබුණි. නමුත් එම වෙනස ගැළපූ පසුව තවදුරටත් රු.9,252 ක නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය විය.

## 2.9 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 51.67 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.6,463,476 ක්වූ තැන්පතු 62 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 565 (5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කෙරෙන මාසික තැන්පතු සාරාංශ ඊළඟ මාසය අවසන් වීමට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුම් 04කට අදාළ මාසික තැන්පතු සාරාංශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2.10 බැංකු ගිණුම් මෙහෙයවීම

### ගැලපුම් කළයුතු ශේෂ

දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු බැංකු ගිණුමට අදාළව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නිකුත් කළ නමුත් මාස 06 ක් ඇතුළත බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු රු. 3,364,459 ක් වටිනා චෙක්පත සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව බැංකුව විසින් සෘජු ගෙවීම් ලෙස දක්වා තිබුණු එකතුව රු.මිලියන 0.02 ක් වටිනා ශේෂ 08 ක් සම්බන්ධයෙන් එහි නිවැරදිභාවය සොයා බලා අවශ්‍ය ගැලපීම් කිරීමට 2018 ජූලි මස වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව බැංකුව වෙත සෘජු ලැබීම් රු.මිලියන 0.05 ක් සඳහන් කර තිබුණි. එම ලැබීම් හඳුනාගෙන උචිත පරිදි ගිණුම් ගත කිරීමට 2018 ජූලි මස වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාර ඇප ලේඛනයක් පවත්වා නොතිබුණු අතර මුදල් රෙගුලාසි 237(ආ) ප්‍රකාරව තොග ලේඛනය (පොත් ගබඩාව) ද යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**2.12 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණක තනතුර 2011 ජූලි 28 දින සිට අනුමතව තිබුණද මෙතෙක් එම තනතුර පුරප්පාඩුව පැවතුණි. අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන කටයුතු සිදු කරනු ලබන අතර 2017 වර්ෂය තුළදී විගණන විමසුම් 06 ක් නිකුත් කර තිබුණි.

**2.13 මානව සම්පත් කළමනාකරණය**

**2.13.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 310.91 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.441,629 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 14 | 12 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 624 | 549 | 75 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 155 | 114 | 41 |
| (v) | අනියම්/කොන්ත්‍රාත්/ | 47 | 25 | 22 |
| | එකතුව | 856 | 704 | 152 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමට ඇතුළත් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ හා අභ්‍යන්තර විගණක පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරමින් පැවතුණද සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම පුරප්පාඩු පුරවා නොතිබුණි.

(ආ) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් වීඩියෝ ශිල්පී හා ඡායාරූප ශිල්පී නිලධාරීන් දෙදෙනෙකු 2016 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2018 ජූලි 31 දක්වා දෙපාර්තමේන්තුවේ සේවයට යොදවා ගෙන තිබුණි.

(ඇ) අනුමත සේවක සංඛ්‍යාව තුළ ඇතුළත් නොවූ "පුහුණු උපදේශක" නම් වූ තනතුරක් සඳහා බඳවාගත් පුද්ගලයකුට එකතුව රු.490,378 ක මාසික දීමනා 2014 වර්ෂයේ සිට 2017 පෙබරවාරි මාසය දක්වා ගෙවා තිබුණි.